මාධ්‍ය නිවේදන අංක - 22

**පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08**
**තැපැල් ඡන්ද පත්‍රිකා ලකුණු කිරීම සම්බන්ධයෙන්**
**සහතික කිරීමේ නිලධාරීන් සහ තැපැල් ඡන්ද හිමියන් සඳහා උපදෙස්**

1 මෙම ඡන්ද විමසීමට අදාලව සහතික කිරීමේ නිලධාරීන් වශයෙන් පත් කර ඇති සියලුම සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාලවලදී 2010.03.25 සහ 26 දෙදින තැපැල් ඡන්ද හිමියන් විසින් ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම සිදු කරනු ලැබේ.

2 ඡන්ද මධ්‍යස්ථානයක කටයුතු කරනු ලබන ආකාරයට තැපැල් ඡන්ද ලකුණු කරනු ලබන ස්ථානයෙහිද කටයුතු කළ යුතුය.

3 සහතික කිරීමේ නිලධාරී සහ ඔහුගේ කාර්ය මණ්ඩලය, සුදුසුකම් ලැබූ තැපැල් ඡන්ද හිමියන්, තරඟ කරන පක්ෂ සහ කණ්ඩායම් නියෝජනය කරන ඡන්ද ස්ථාන නියෝජිතයින් (දෙදෙනකු බැගින්), ෆැපරල් සහ සීඑම්ඊවී යන ආයතනය නියෝජනය කරන නිරීක්ෂකයින් (එක් අයකු බැගින්), තේරීම්භාර නිලධාරී විසින් නම් කරනු ලබන අධීක්ෂණ නිලධාරීන් සහ ආරක්ෂාව සඳහා පත්කර ඇති පොලිස් නිලධාරීන් හැර වෙනත් කිසිවකුට ඡන්ද විමසීම අවස්ථාවෙහි සහතික කිරීමේ නිලධාරී කාර්යාලයෙහි රැඳී සිටිය නොහැක.

4 තරඟ කරන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයින්ට වරකට එක් අයකු බැගින් ඡන්දය ප්‍රකාශ කරන ස්ථානය නිරීක්ෂණය කළ හැකිය. වෙනත් කිසිම රාජ්‍ය නොවන සංවිධාන, දේශපාලන පක්ෂ හෝ වෘත්ති සමිති නියෝජිතයින් කිසිවකුට ඡන්ද පත්‍රිකා සලකුණු කරනු ලබන අවස්ථාවෙහි එම ස්ථානයට ඇතුළු වීමට අවසර නැත.

5. ඡන්ද පත්‍රිකා සලකුණු කරන ස්ථානයේ, කාර්යාල පරිශ්‍රයේ හෝ දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක හෝ බැනර්, කටවුට්, දැන්වීම්, කොඩි හෝ වෙනත් ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය නොකළ යුතුය. ඡන්ද පත්‍රිකා සලකුණු කරනු ලබන කාමරයේ අපේක්ෂකයකුගේ ඡායාරූප තිබේනම් ඒවා ඉවත්කිරීම හෝ ආවරණය කිරීම කළ යුතුය.

6. ජංගම දුරකථන, ගිනි අවි, අවි ආයුධ සහ කැමරා ඡන්ද පත්‍රිකා සලකුණු කරන ස්ථානයට ගෙන ඒම සම්පූර්ණයෙන් තහනම්ය. ඡන්ද පත්‍රිකා ලකුණු කිරීමේ ස්ථානය තුළ ඡායාරූප ගැනීමට ඉඩ නොදිය යුතුය.

7. ඡන්ද දායකයාට රහස්‍ය ලෙස ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීමට පහසුකම් සැලසිය යුතුය. ලකුණු කරණ ලද ඡන්ද පත්‍රිකාව හොඳින් නවාගෙන විත් සහතික කිරීමේ නිලධාරී ඉදිරියේදී 'බී' කවරයට බහා ලීමට උපදෙස් දිය යුතුය. සහතික කිරීමේ නිලධාරී විසින් 'බී' කවරය මුද්‍රා තබා එම 'බී' කවරයට පිටතින් අනන්‍යතා ප්‍රකාශය අමුණා ' ඒ ' කවරයෙහි බහා මුද්‍රා තබා එදිනම රක්ෂණ තැපෑලෙන් අදාල තේරීම්භාර නිලධාරී වෙත යැවීම සඳහා තැපැල් කාර්යාලය වෙත භාර දිය යුතුය. ඡන්ද පත්‍රිකා අඩංගු කවර තැපැල් පෙට්ටියට නොදැමිය යුතුය.

8. සලකුණු කළ ඡන්ද පත්‍රිකාවක් වෙනත් අයකුට පෙන්වීම හෝ පෙන්වීමට අනුබල දීම බරපතල වරදකි.

දයානන්ද දිසානායක
මැතිවරණ කොමසාරිස්

මැතිවරණ මහ ලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය. 10107
2010.03.23 දින.
LAEB/COM4/Ga_PE-2010-22

# MEDIA RELEASE NO: 22

## Parliamentary Election – 08.04.2010
## Instructions to Certifying Officers regarding
## MARKING OF POSTAL BALLOT PAPERS

The marking of postal ballot papers by postal voters will be held on 25th and 26th March, 2010 at the offices of various Certifying Officers situated all over the country.

2. Places at which marking of postal votes are treated in the manner in which a normal polling station functions.

3. Admission should be strictly limited to the Certifying Officer and his staff, postal voters, two duly authorized polling agents and an observer each of PAFFREL and CMEV. Polling Agents should not be members of the staff of the institution or the office of the Certifying Officer. Any officer sent by the Returning Officer to supervise the proceedings should also be permitted to remain inside. Police officers deployed for security could also remain nearby.

4. One candidate of each political party and independent group contesting in election could also observe the process. No other person such as representatives of trade unions, political parties, NGOO should be permitted inside.

5. Any banners, cut outs, posters, political party flags or other publicity material of a political party, independent group or of a candidate should not be displayed in the room, approaching area, premises or immediate vicinity of the marking centre.

6. Cellular telephones, firearms, weapons, cameras are not allowed inside the room. Photographing of the centre will not be allowed.

7. Facilities should be made available for the voters to mark the ballot paper in secret. Marked ballot paper should be folded by the voter and inserted into the envelope "B" in the presence of the Certifying Officer. The Certifying Officer should seal the envelope "B", enclose it in envelope "A" and attach the completed form of declaration of identity to the envelop. The sealed insured packets should be delivered to the Post Office on the same day. Envelopes containing ballot papers should not be dropped into the Post Box.

8. Any voter who attempts to show his marked ballot paper or any person who influences voters to show the marked ballot paper commits an offence under the Parliamentary Elections Act.

Dayananda Dissanayake
Commissioner of Elections

Elections Secretariat,
Sarana Mawatha,
Rajagiriya 10107
March 23, 2010